# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

*කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන අංශයේ ප්‍රකාශනයකි*

**තාක්ෂණික පත්‍රිකා අංක 05**

## 2012 - 2013 මහ කන්නයේ කලට වැසි වසියි !

දැනට වායුගෝලයේ පවත්නා තත්ත්වය අනුව මෙවර මහ කන්නයේ වැසි සුපුරුදු පරිදි ලැබේ යැයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සුභවාදී ආකල්පයක් දරයි. එබැවින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කලමණාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්.එම්.ඒ.ඩී.බී. වික්‍රමසිංහ මහතා සහ එහි දේශගුණ විද්‍යාඥ ආචාර්ය බී.වී.ආර්. පුණ්‍යවර්ධන මහතා විසින් මහ කන්නයේ කෘෂිකර්ම කටයුතු සඳහා සූදානම් වන ලෙස දැනුම් දෙයි.

තවද, කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඩබ්. සකලසූරිය මහතා විසින් ඉදිරි කන්න රැස්වීම් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තු වල නිලධාරීන් සක්‍රිය ලෙස සහභාගි වී අවශ්‍ය කටයුතු සැලසුම් කර ගන්නා ලෙස දැඩිව අවධාරණය කරයි.

- **ඉදිරි මහ කන්නයට සූදානම් වීම සඳහා,**

- තාක්ෂණික පුහුණු පන්ති ආදිය පවත්වා ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම
- හැකිතාක් දුරට වැසි ජලයෙන් බිම් සකසීමට කටයුතු කරන ලෙස ගොවීන් දැනුවත් කිරීම
- ප්‍රදේශයට අවශ්‍ය වන බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවයන් දැනුවත් වී ගොවීන් හට ඒවා ලබා ගැනීමට පහසුකම් සැපයීම
- වී වගාව සඳහා **මාස 3 1/2** වයස් කාණ්ඩයට අයත් වී ප්‍රභේද භාවිතයට සැලසුම් කිරීම

සැ.යු. - මේ පිළබඳව කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින්ද අදාල කටයුතු දැනුවත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අධීක්ෂණය හා උපදෙස් | අචාර්ය රොහාන් විජේකෝන් මයා | - අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන) |
| සැකසුම | චාමරී නිලූෂි සිල්වා | - කෘෂිකර්ම උපදේශක (සන්නිවේදන) |